එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492**

**ආයතනයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் :** 492
**அரசாங்க தகவல் திணைக்களம்**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களையும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்பித்தல்.

**Parliamentary Series No: 492**

**Name of the Institution : Department of Government Information**

Submission of Observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

අංක 119(4) දරණ ස්ථාවර නියෝග පරිදි රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ නිරීක්ෂණ හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ග්‍රන්ථමාලා අංකය : 492

ආයතනයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

| හඳුනාගත් අඩුපාඩු | අඩු පාඩු නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය |
|---|---|
| 01. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර 2023.01.12 දින සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.<br>රජයේ ආයතන සඳහා ඉදිරි වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ඉදිරිපත් කළ යුතු නමුත් විවිධ හේතූන් මත 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට පෙර නියමිත පරිදි පිළයෙල කිරීමට නොහැකි වුණි. නමුත්, 2024 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාකාරී සැලැස්ම නියමිත පරිදි දෙසැම්බර් 15 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| 02. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | අංශ මගින් පිළිතුරු ලබා දීමේදී යම් යම් ප්‍රමාදයන් සිදු වන අතර විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙස අංශ වෙත උපදෙස් ලබා දී ඇත. |
| 03. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ ජූනි මස සිට දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර ඇති අතර මේ වන විට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පවත්වනු ලැබේ. |
| 04. 2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට මිලදී ගන්නා ලද සහ අපහරණය කරන ලද වත්කම් සම්බන්ධ තොරතුරු නිසි පරිදි නියමිත දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. |
| 05. 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023.12.31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2024.09.09 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2024.12.31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවද 2025.06.13 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| 06. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2024 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලට අදාළව විසඳුම් ලබාගෙන අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. |
| 07. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් පරිපාලන ක්‍රියා මාර්ග අසාර්ථක වූ බැවින් ඕ.සී.එල්. ද සිල්වා මහතාගේ ආදායම් වාර්තාව සලකා බලා, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ද උපදෙස් පරිදි ඔහුගේ උරුමක්කරුවන් වන පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පුතුන් දෙදෙනාගෙන් අය කිරීමට උත්සාහයක් ලෙස කරන ලද දැනුම් දීමට අනුව, ඊට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා පොලිස් මුලස්ථානය වෙත ලිපි යොමු කර ඇත. |

එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

| | |
|---|---|
| 08. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | මේ වන විට තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීම සිදු කරගෙන යනු ලැබේ. |
| 09. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | 2018.01.24 දිනැති අංක 02/2018 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය ඇගයීම සඳහා කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමේ අවශ්‍යතාවයක් හඳුන්වා දී තිබුණි. නමුත් මෙම දෙපාර්තමේන්තුව සඳහා එය සකස් කර නොතිබූ බවට එකඟ වෙමි.<br><br>2023 වර්ෂය වනවිට එය පිළියෙල කිරීමට අදාළ කටයුතු ආරම්භ කළද, 2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (I) හි 03 ඡේදය මගින් 02/2018 චක්‍රලේඛය පහත පරිදි සංශෝධනය කර ඇත.<br><br>'රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි (1) ඡේදය මින් සංශෝධනය කරනු ලබන අතර ඒ අනුව එම චක්‍රලේඛයේ සඳහන් පරිදි "වාර්ෂික කාර්ය සාධන ගිවිසුම්" අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ'.<br><br>එබැවින් එම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු නොකරන ලදී. |
| 10. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 13% ක් සඳහා පැය 12ක පුහුණු අවස්ථාවන් ද, 2.38% ක් සඳහා පැය 06ක පුහුණු අවස්ථාවන් ද ලබා දී ඇත. මෙම පුහුණු අවස්ථා ලබාදීම අවම වශයෙන් සිදුවී ඇති අතර වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛ හා නිලධාරීන්ගේ පුහුණු ඉල්ලීම් ඉදිරිපත් නොවීම යන කරුණු ඊට බලපාන ලදී. එසේම 2024 වර්ෂයේ පැය 12ක් සම්පූර්ණ කළ නිලධාරී පුහුණු අවස්ථා 37.19% ක් වූ අතර පැය 06 සම්පූර්ණ කළ නිලධාරීන් 17.58% ක් විය. එම වසරේ නිලධාරීන් සඳහා පොදු පුහුණු අවස්ථා ලබාදීමේ වැඩි ඉඩක් පැවතුණි. 2025 වර්ෂයේ පැය 12 සම්පූර්ණ කළ නිලධාරීන් 24.70% ක් වූ අතර පැය 06 සම්පූර්ණ කළ නිලධාරීන් 11.95% ක් විය. 2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අත්‍යවශ්‍ය තාක්ෂණ පුහුණු ද එයට අයත් විය. |
| 11. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. | 2023 වර්ෂයට අදාළව යටත්ව මතයක් ලබා දී තිබුණි. |

එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.